රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2017

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.08.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තියට නව විධිවිධාන ඇතුළත් කිරීම

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී වගන්තියේ 11:8:8 උප වගන්තියට පහත නව උප වගන්ති ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට 2017.07.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

11:8:8:1 අදාළ දේපළ ණය ශේෂය නියමිත බැංකුව වෙත නිරවුල් කිරීමෙන් අනතුරුව, ඒ බව නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනයේ ආයතන ප්‍රධානියා වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කළ යුතුය.

11:8:8:2 වෛද්‍ය හේතු මත විශ්‍රාම ගන්වා ණය ඇපකර අරමුදල මඟින් දේපළ ණය ශේෂ නිරවුල් කරන ලද නිලධරයෙකු නැවත සේවයේ පිහිටුවුවහොත් නැවත සේවයේ පිහිටු වූ දින සිට ණය ශේෂය නිරවුල් නොකරන ලද්දේ නම් නිලධරයා බැංකුව වෙත ගෙවිය යුතු මාසික ණය වාරිකය සහ නිලධරයාගෙන් අය කළ යුතු මාසික පොලිය සේවයේ නොසිටි කාලයට අදාළ වාරික සහ පොලී මුදල අත්හැර නැවත සේවයේ පිහිටු වූ දින සිට ඔහුට/ඇයට ගෙවනු ලබන පාරිශ්‍රමිකයෙන් මාසිකව අය කර රජයේ විවිධ ආදායමට බැර කිරීමට පාරිශ්‍රමිකය ගෙවනු ලබන ආයතනය විසින් කටයුතු කළ යුතුය.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2017.07.18 සිට බලාත්මක වේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය